
# එක්තරා වෙළඳ ආයතනයක කතාවක්

## ඇන්ටන් චෙකෝෆ් 1892 දී ලියා පළ කළ කෙටි කතාවකි .

රුසියානු මුල් බසින් අනුවාදය ආචාර්ය පාලිත ගණේවත්ත



ඇන්ටන් චෙකෝෆ්




ආචාර්ය පාලිත ගණේවත්ත



තම මව් පාර්ශවයෙන් උරුම වූ රූබල් හැර දහස යොදවා පොත් හලක් ආරම්භ කිරීමට අන්ද්රේ අන්ද්රේවිච් සීදරව් තීරණය කළේ ය. නගරවාසීහු නුගත්බවේ හා අවිචාරවත් බවේ ගිලී සිටියහ. මහල්ලන් වාෂ්ප ස්නානාගාරයට ගොස් කල් ගත කළ අතර රජයේ නිලධාරීහු බූරුවා ගසමින් වොඩ්කා පානය කළහ. කාන්තාවෝ ඕපාදූප දෙඩූහ. තරුණයෝ අරමුණකින් තොරව දිවි ගෙවූහ. තරුණියෝ බජිරි කමින් විවාහ ජීවිතය ගැන සිහින මැවූහ. මිනිස්සු තම බිරියනට තැලූහ. ඌරෝ පාරතොටේ නිදැල්ලේ හසුරුණෝ ය.

'අලුත් අදහස්...නව අදහස් අවශ්‍ය වී තිබෙනවා'යි අන්ද්රේ අන්ද්රේවිච් සිතුවේ ය. ' නව අදහස් අවශ්‍යයි'




පොත් හල සඳහා ගොඩනැගිල්ලක් බද්දට ගත් ඔහු මොස්කව් නුවරට ගොස් පැරණි හා වත්මන් ලේඛකයන්ගේ පොත්පත් හා පාසල් පොත් රාශියක් මිලදී ගෙනැවිත් ඒවා පිළිවෙළකට රාක්කවල තැන්පත් කළේ ය. පළමු දින තුනේදී පොත් මිලදී ගැනීමට කිසිවකු පැමිණියේ නැත. අන්ද්‍රේ අන්ද්‍රේවිච් කවුන්ටරය පිටුපස හිඳගෙන මිහයිලව්ස්කි ගේ පොතක් කියවමින් අවංකව කල්පනා කරන්ට තැත් කළේ ය. මාළුත් සමග කැඳ ටිකක් බොන්ට දැන් හොඳ වෙලාව යයි ඇතැම් විටක ඔහුට නිරායාසයෙන්ම සිතුණු නමුත් එය ඉතා තුච්ඡ අදහසකැයි එවෙලේම වාගේ සිතිණ.

හැම උදෑසනකම ගවුමක් ඇඳ හම් සපත්තු යුවළක් පැළඳි දැරියක් ඊතලයක් මෙන් දිව අවුත් මෙසේ කිවා ය.

'කෝප්ප දෙකක විනාකිරි දෙන්න'

අන්ද්‍රේ අන්ද්‍රේවිච් ඇය දෙස අවඥා සහගත බැල්මක් හෙළා ' මේ ළමයට වැරදිලා, අල්ලපු කඩේ' යි පිළිතුරු දුන්නේ ය.

ඔහුගේ හිතවතකු පොත් කඩයට පැමිණි විට ඔහු බැරෑරුම් හා රහසිගත ස්වරූපයක් මුවට නගා ගෙන උඩින්ම ඇති රාක්කයෙන් පීසරයෙව්ගේ එකතු කළ එකතු කළ කෘති සංග්‍රහයේ තුන්වන වෙළුම ගෙන කටින් පිඹ එහි දූවිලි ඉවත් කර ඔහු විසින් පෙන්වීමට බිය සැක පහළ කරන තවත් වටිනා දේ තම පොත් සාප්පුවේ ඇති බව හඟවන්නාක් වැනි ස්වරයෙන් මෙසේ පැවසුවේ ය.

' මේ යාළුවා, මේක ලේසි පාසු පොතක් නොවෙයි, මං මේ නිකමට නොවෙයි කියන්නෙ. කොටින්ම කිව්වොත් මේක කියෙව්වහම තේරෙයි, ඔව් මේ බලන්න යාළුවා..... මේක බොහෝම බැරෑරුම් පොතක්'

සති තුනකට පසුව පළමුවරට පොත් මිලදී ගැනීමට එක්තරා මහත්මයෙක් පැමිණියේ ය. තරබාරු සිරුරකින් හා සුදු හිසකෙසින් යුතු ව දෙකපොලේ රැවුල වවාගෙන සිටි ඔහු හමුදා නිලධරයකු මෙන් තොප්පියක් පැළඳ සිටියේ ය. ඔහු දෙසැ බැලූ සැනෙකින්ම ඔහු ඉඩම් හිමියකු ලෙස පෙණින.

ඔහු 'ජාතික වදන' සඟරාවේ දෙවන වෙළුම ඉල්ලා සිටියේ ය.

'ගල්ලෑ ලි විකුණන්නේ නැත්දැ'යි අනතුරුව ඔහු විමසී ය.

'නෑ විකුණන්නෙ නෑ '

'ෂෑ ඒ වගේ පොඩි දෙයකට පොළට යන්ට හිතෙන්නෑ '

'ඇත්තටම ගල්ලෑ ලි ටිකක් විකුණන්ට නොතියන එක හරි පාඩුවක්'යි ඔහු ගිය පසු අන්ද්‍රේ අන්ද්‍රේවිච් කල්පනා කළේ ය.' මේ වගේ පළාත්වල එක බඩු වර්ගයක් විතරක් විකුණන්ට තියෙන එක පාඩුවක්. ඉස්කෝලෙ වැඩට ඕනෙ කරන හැම ආම්පන්නයක්ම විකුණන්ට තියන්ට ඕන. නැත්තන් වැඩක් නෑ'

ඔහු මොස්කව් නුවරට භාණ්ඩ රැසක් ඇණවුම් කර ලිපියක් ලීවේ ය. මාසයක් ගත වන්ට පෙර පෑන් තුඩු ,පැන්සල්, පෑන් ,ඇක්සයිස් පොත්, ගල්ලෑලි ඇතුළු පාසල් දරුවන්ට උවමනා සියලු දේ පොත් හලේ වීදුරු ජනේල අතරින් දකින්නට ලැබිණ. පාසල් ළමෝ ඔවුනට අවශ්‍ය දේ මිලදී ගැනීම පිණිස ඉඳ හිට පැමිණියහ. එක් දිනක් ඔහුට රූබලයක් හා කොපෙක් හතලිහක ලාබයක් ඉපයීමට හැකි විය. හම් සපත්තු යුවලක්

පැළඳි ගැහැණු ළමයා දිනක් ඊතලයක් මෙන් දිව ආ විගසම 'වැරදිලා... අල්ලපු කඩේ' යි කීමට කට අරිනවාත් සමගම ඇය මහා හඬින් මෙසේ මොර දුන්නා ය.

'කොපෙක් එකක කඩදාසියි, කොපෙක් හතක මුද්දරයි දෙන්න'

ඉන්පසුව තැපැල් මුද්දර හා ලාංචන සහිත මුද්දර පමණක් නොව බිල් පත් ලිවීමට ගන්නා කඩදාසි ද අන්ද්‍රේ අන්ද්‍රේවිච් තම කඩයේ තබා ගත්තේ ය. පොත් හල අරඹා මාස හතකට පසුව එක් කාන්තාවක් පවුන්ටන් පෑන් මිලදී ගැනීමට පැමිණියා ය.

'ඉස්කෝලෙ අරන් යන බෑග් තියෙනවද ? පිටේ එල්ලන් යන ඒවා' ඇය විමසුවා ය.

'අපි ළඟ නෑ නෝනා'

'ෂඃ හරි වැඩේනෙ. එහෙනම් මට පෙන්නන්න මොනවද තියෙන බෝනික්කො කියල, හැබැයි ලාබ ඒව'

'නෝන මහත්තය, බෝනික්කො විකුණන්නේ නෑ'යි අන්ද්‍රේ අන්ද්‍රේවිච් ශෝකී ස්වරයෙන් කිවේ ය.

ඔහු වැඩිකල් නොයවා මොස්කව් නගරයට ගිය අතර ඉන්පසු පාසල් ළමුන්ගේ පොත් බෑග්, බෝනික්කන්, නොයෙක් සෙල්ලම් රබාන්, නැම්ච්ච කඩු, ටෙනිස් බෝලහා සංගීත භාණ්ඩ ඇතුළු විවිධාකාර සෙල්ලම් බඩු කඩයේ දක්නට ලැබිණ.

'කිසි පලක් නෑ මේවායින්' යි ඔහු තම යාළු මිත්‍රයන්ට කිවේ ය. ' ඔන්න බලන්න මම ඉස්කෝලෙ පොතුයි සෙල්ලම් බඩුයි විකුණනව. මගේ දැන උගත්කමට තියෙන ආසාව ඉබේම අඩුවෙලා ගිහින්. කොටින්ම කියනවා නම් විද්‍යාත්මක දේවල් මොන වැඩකටද?'

පාසල් ළමුන් පාවිච්චි කරන කිරුම් පඩි, විවිධ බෝල වර්ග, බිලියඩ්, සෙල්ලම් උදලු, රේක්ක ආදියත් නවීන පන්නයේ ක්‍රීඩා සහිත සෙල්ලම් බඩුත් රාශියක් ඔහු මිලදී ගත්තේ ය. ඉන්පසු කඩය පසු කර යන අය විමතියට පත් කරමින් ඒ තුළ තබා ඇති ලොකු බයිසිකලයක් හා කුඩා බයිසිකලයක් දක්නට ලැබිණ. වෙළඳාම ඉතා සරු විය. නත්තල ලඟාවෙද්දී නත්තල් ගස්වල සැරසිලි විකිනීමට ඇති බව දන්වමින් අන්ද්‍රේ අන්ද්‍රේවිච් කඩයේ ජනේලයේ දැන්වීමක් ඇලෙව්වේ ය. බොහෝ දෙනෙක් කඩයට පැමිණෙන්නට වුහ.

'තව සනීපාරක්ෂක බඩු ටිකකුත් ගේන්ට ඕනෙ' යි ඔහු දෑත පිරිමදිමින් තම හිත මිතුරන්ට කිවේ ය. ' මට පොඩ්ඩක් මොස්කව් වලට යන්ට දෙන්ට. මම ගේන්නම්කො වතුර ෆිල්ටර් හා විද්යාත්මක උපකරණ . ඒව දැක්කම පිස්සු වැටෙනව. කොටින්ම කියතොත් යාළුවා නවීන විද්‍යාව අමතක කරන්ට හොඳ නෑ ...'හොඳම නෑ '

වෙළඳාමෙන් බොහෝ මුදල් රැස් කළ විටෙක මොස්කව් නගරයට ගිය ඔහු අත්පිට මුදලට හා ණයට රූබල් පන් දහසක වියදමින් නොයෙක් ආකාරයේ බඩු භාණ්ඩ මිලදී ගත්තේ ය. ෆිල්ටර් වර්ග, ලියන මේසයේ තබන අලංකාර නවීන ලාම්පු, ගිටාර, ළමයින් සඳහා සනීපාරක්ෂක යට ඇඳුම්, ළදරුවන්ගේ සූප්පු, අත් බෑග හා වියළි කුරුම්ණි සතුන් තැන්පත් කළ සත්ව විද්යාත්මක නියැදි ද ඒ අතර විය.

රූබල් පන්සියයක් වියදම් කර කදිම හැඩ දැමූ පිඟන් භාණ්ඩ රැසක් ම මිලදී ගත් ඔහු ඒ ගැන මහත් සතුටට පත් විය. සුන්දර වස්තූන් කලාත්මක රුචිය වර්ධනය කරන අතර ඒ මගින් චිත්ත ස්වභාවය මෘදු වන බව ඔහු විශ්වාස කළේ ය. මොස්කව් නුවර සිට පෙරළා පැමිණි ඔහු මිලදී ගත් නව පන්නයේ බඩු භාණ්ඩ සාප්පුවේ රාක්ක හා තට්ටුවල තැන්පත් කරන්ට වූයේ ය. මේ අතර උඩ රාක්කයක් පිරිසිදු කිරීමට උඩට නැග්ග විට ඇති වූ සෙලවීමෙන් රාක්කය උඩ තිබූ මිහයිලව්ස්කිගේ එකතු කළ වෙළුම් දහය එකින් එක ලිස්සා බිමට වැටුනේ ය. එක් වෙළුමක් ඔහුගේ හිසට තද පහරක් එල්ල කරමින් වැටුණු අතර තවත් වෙළුමක් කෙලින්ම පහළට විත් ලාම්පු උඩ වැටීමෙන් ලාම්පු දෙකක වීදුරු ආවරණ බිඳී ගියේ ය.

'ඇත්තටම මේ මිනිස්සු මෙච්චර විශාල පොත් මොන එහෙකට ලියනවද මන්ද 'යි අන්ද්‍රේ අන්ද්‍රේවිච් කොන්දුරන්නක් මෙන් තෙපළේ ය.

ඔහු සියළු පොත් එකතු කර ලණුවකින් තදින් බැඳ කවුන්ටරය යට සඟවා තැබුවේ ය. ඉන් දෙදිනකට පසුව යාබද කඩයේ සිල්ලර වෙළෙන්දා ස්වකීය බෑණාට වධ බන්ධන දීම හේතු කොට ගෙන බරපතළ වැඩ සහිතව හිර කරුවන්ගේ හමුදාවට බැඳෙන්නට නියමවීම නිසා ඔහුගේ කඩ කාමරයත් විකුණන බව අන්ද්‍රේ අන්ද්‍රේවිච්ට දැන ගන්නට ලැබිණ. ඔහු මහත් සතුටට පත්ව ඒ කඩ කාමරය තමන් සඳහා වෙන්කර තබන ලෙස දන්වා සිටියේ ය. වැඩි කලක් නොගොස්ම කඩ කාමර දෙක වෙන් කළ බිත්තිය හරහා දොරක් සවි කර එක් කඩයක් බවට පත්වී එය නොයෙක් බඩු භාණ්ඩ වලින් පිරිණි. අලුතෙන් එකතු කරගත් කඩ කාමරයට පැමිණි ගනුදෙනු කරුවන් පරණ පුරුද්දට තේ කොළ, සීනි, බූමිතෙල් ආදිය ඉල්ලන්නට වූයෙන් අන්ද්‍රේ අන්ද්‍රේවිච් ඉක්මනින්ම සිල්ලර බඩු ද විකිණීමට තැබුවේ ය.

දැන් එය නගරයේ විශාලතම වෙළඳ ශාලාවලින් එකකි. පිඟන් කෝප්ප, දුම්කොළ, සබන්, බනිස්, පන් වර්ග, මැහුම් ගෙතුම් උපකරණ, තුවක්කු, හම භාණ්ඩ හා ඌරු ගාත් ද එහි විකිණීමට තිබිණ. ඔහු සති අන්ත පොළේ තැබෑරුම් කුටියක්ද කුලියට ගත්තේ ය. උණුසුම් වාෂ්ප ස්නානාගාරයක් ද විවෘත කිරීමට ඔහු සූදානම් වන බවට ආරංචි පැතිර ගියේ ය. පීසරයෙව්ගේ තුන්වන වෙළුම ඇතුළු කලින් රාක්කවල තිබුණු පොත්පත් රාත්තල් තිස් හය රූබලයයි කොපෙක් පහ ගණනේ විකුණා දැන් බොහෝ කල් ය.

නගරයේ නම් ප්‍රසිද්ධ කිරීම් හෝ විවාහ මංගල උත්සව වලදී අන්ද්‍රේ අන්ද්‍රේවිච් විහිළුවට මෙන් 'ඇමෙරිකානුවන්' ලෙස හඳුන්වන පැරණි මිතුරන් ඔහුට හමු වේ. ඔවුහු ඇතැම් විට කලා සංවර්ධනය, සාහිත්‍යය හා නොයෙකුත් ශාස්ත්‍රීය විෂයයන් ගැන ඉඳහිට කතාබස් කරන්ට පටන් ගනිති.

'අන්ද්‍රේ අන්ද්‍රේවිච් 'යුරෝපීය පුවත්' සඟරාවේ අන්තිම කලාපය කියෙව්වදැ' යි ඔවුහු ප්‍රශ්න කරති.

' නෑ කියෙව්වෙ නෑ' යි ඔහු දෑස් අඩවන් කර මහත අත් ඔරලෝසු පටිය පිරිමදිමින් පවසයි.

'ඒවා අපට අදාල වෙන්නෙ නෑ. අපි ඊට වඩා වැදගත් කටයුතු වල නිරත වෙලා ඉන්නෙ'